ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2000 අංක 50 දරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 2000 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 අගෝස්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

## 2000 අංක 50 දරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින.]

එල්. ඩී.–ඕ. 24/99.

### 1985 අංක 6 දරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2000 අංක 50 දරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 6 දරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනතේ දීර්ඝ නාමය එහි "ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය" යන වචන වෙනුවට "ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1985 අංක 6 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක –

(අ) "ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනත" යන වචන යෙදෙන සෑම අවස්ථාවක දී ම ඒ වචන වෙනුවට "ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතන පනත" යන වචන ද, සහ

(ආ) "ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය" යන වචන යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ වචන වෙනුවට "ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය" යන වචන ද

ආදේශ කරනු ලැබිය යුතු ය.

"ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනත" සහ "ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය", "ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතන පනත" සහ "ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, ප්‍රකාශනයක හෝ වෙනත් ලේඛනයක "ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනත" සහ "ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ

ආයතනය" යන වචන සඳහන් කර ඇති සෑම අවස්ථාවක දී ම එම සඳහන් කිරීම පිළිවෙලින් "ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතන පනතට" සහ "ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනයට" කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

අන්තර් කාලීන විධිවිධාන.

4. (1) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය විසින් හෝ ඒ සමග ඇතුළත් වූ ද නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි පැවතියා වූ හෝ බලාත්මකව තිබුනා වූද සියලු ගිවිසුම් හා එකඟවීම්, ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය වෙනුවට ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය ඒවාට පාර්ශ්වකරුවෙක් වූයේ නම් ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය විසින් ඇතුළත් වන ලද ගිවිසුම් සහ එකඟවීම් ලෙසින් සම්පූර්ණයෙන්ම සහ ක්‍රියාත්මක ලෙසින්ම සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කළ හැකි ය.

(2) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබුවා වූ සහ, නියමිත දිනයට ඉහතින් ම වූ දිනයේ දී විනිශ්චයට භාජනය වෙමින් පැවතියා වූ සියලු සිවිල් නඩු, අපරාධ නඩු, අභියාචනා සහ වෙනත් නීති කෘත්‍ය ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබූ සිවිල් නඩු, අපරාධ නඩු, අභියාචනා හෝ වෙනත් නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව නොකඩව පවත්වාගෙන යා හැකි ය.

(3) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනයේ වාසියට හෝ ඊට එරෙහිව කරනු ලැබුවා වූ ද, නියමිත දිනට ඉහතින්ම වූ දිනයේ දී ඉටු නොකර පැවතියා වූ ද, සියලු නඩු තීන්දු සහ ආඥා ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනයේ වාසියට හෝ ඊට එරෙහිව කරනු ලැබූ නඩු තීන්දු සහ ආඥා ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් හැර නියමිත දිනට ඉහතින්ම වූ දිනයෙහි පැවති ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනයේ අනිකුත් සියලු අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම්, ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනයේ අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "දිගන" යන වචනය වෙනුවට "බත්තරමුල්ල" යන වචනය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) "වාරිමාර්ග ක්‍රමවල" යන වචන වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් ක්‍රමවල" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "වාරිමාර්ග" යන වචනය වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "වාරිමාර්ග ක්‍රමවල" යන වචන වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් ක්‍රමවල" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඈ) ඒ වගන්තියේ (ඈ) ඡේදයේ "වාරිමාර්ග" යන වචනය වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි "වාරිමාර්ග ක්‍රමවල" යන වචන වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් ක්‍රමවල" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "වාරිමාර්ග ක්‍රමවල" යන වචන වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් ක්‍රමවල" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි "වාරිමාර්ග ක්‍රමවල" යන වචන වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් ක්‍රමවල" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ වගන්තියේ (ඈ) ඡේදයෙහි "වාරිමාර්ග ක්‍රමවල" යන වචන වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් ක්‍රමවල" යන වචන ආදේශ කිරීමන් ;

(ඉ) ඒ වගන්තියේ (උ) ඡේදයෙහි "වාරිමාර්ග ක්‍රම" යන වචන වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් ක්‍රම" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඊ) ඒ වගන්තියේ (ඌ) ඡේදයෙහි "වාරිමාර්ග ක්‍රම" යන වචන වෙනුවට "වාරිමාර්ග සහ ජල සම්පත් ක්‍රම" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.